(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 30]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0086/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006 සහ 2007 වර්ෂ සඳහා කොළඹ මහ නගර සභාවට මධ්‍යම රජයෙන් ලබා දිය යුතුව තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් ප්‍රමාණයන් නොගෙවීමට හේතුව කුමක්ද;

(iii) ඉහත සඳහන් වෙන්කළ මුදල වැටුප් සඳහා වැය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කසළ එකතු කිරීම සඳහා වැය කරන මුදල කොපමණද;

(ii) ඒ සඳහා නිසි අන්දමින් ටෙන්ඩර් කැඳවන ලද්දේ ද හා පත් කරන ලද ටෙන්ඩර්කරු ටෙන්ඩර් අවශ්‍යතා සමග මුළුමණින් අනුකූල වන්නේද;

(iii) පළපුරුද්ද යන නිර්ණායකය සිතාමතාම ඉවත් කළේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සනීපාරක්ෂක සේවා සමාගම විසින් භාවිතා කරනු ලබන කසළ බැහැර කිරීමේ භූමිය කුමක්ද ; හා

(ii) එය නීත්‍යානුකූලව අනුමත කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0087/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ බැංකුව දේශපාලන බලපෑම් වලින් තොරවූ ආයතනයක්ද;

(ii) අද දින වන විට රටේ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ණය ප්‍රමාණයේ මුල් මුදල සහ පොළිය වෙන් වෙන් වශයෙන් සහ 1948, 1955, 1956, 1977, 2001, 2004 සහ 2007 වර්ෂ සඳහා ගෙවිය යුතුව තිබූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රජය විසින් ගෙවීමට ඇති මුදල් පියවීම සඳහා මහ බැංකුව විසින් මුද්‍රණය කර වෙළෙඳ පොළට නිකුත් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 1995 සිට අද දක්වාවූ සෑම වර්ෂයකදීම සැප්තැම්බර් මස 30 වැනි දින වන විට භාණ්ඩාගාර ගිණුමෙන් මහජන බැංකුවට සහ ලංකා බැංකුවට ගෙවීමට තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0088/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2005, 2006 සහ 2007 වර්ෂ සඳහා මධ්‍යම රජය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත ලබා දීමට තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් නොගෙවීමට හේතු කවරේද;

(iii) ඉහත සඳහන් වෙන් කරන ලද මුදල් වැටුප් සඳහා වැය කරන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කසළ එකතු කිරීම සඳහා වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා නිසි ලෙස ටෙන්ඩර් කැඳවනු ලැබුවේද සහ පත් කරන ලද ටෙන්ඩර්කරු ටෙන්ඩර් අවශ්‍යතාවයන්ට පූර්ණ ලෙස අනුකූල වූයේද;

(iii) පළපුරුද්ද යන නිර්ණායකය හිතාමතාම ඉවත් කළේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සනීපාරක්ෂක සේවා සමාගම විසින් භාවිතා කරනු ලබන කසළ බැහැර කරන ස්ථානය කුමක්ද;

(ii) එය නීත්‍යානුකූලව අනුමත කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0204/'08

4.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) වෘත්තීය හා කාර්මික පුහුණු (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0205/’08

5\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0206/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0378/'08

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පරිසර අධිකාරියේ මුදල් අධීක්ෂක තනතුරට බඳවා ගෙන ඇති අයගේ නම, උපන් දිනය සහ වයස කොපමණද;

(ii) ඔහු මෙම තනතුරට බඳවා ගැනීමට තිබූ සුදුසුකම් කවරේද;

(iii) මොහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් මෙම තනතුර දැරීමට ප්‍රමාණවත්ද;

(iv) මොහුගේ මාසික වැටුප හා වෙනත් දීමනා කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයට පත්වීමක් ලැබූ නියෝජ්‍ය අධීක්ෂකවරිය, අනුරාධපුර සහ මහනුවර කාර්යාලවල සේවයේ යොදවා ඇත්තේ කවර පදනමකින්ද;

(ii) ඇය ලබන මාසික දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දියතලාව යුද හමුදා කඳවුරට අයත් පෝලෝ ක්‍රීඩා පිටියට යාබදව හලංගොඩ වැව ඉස්මත්තේ අනවසරව මැණික් ඉල්ලම් හාරන බවත්;

(ii) මෙම ඉල්ලම් සහිත පස් රැගෙන ගොස් නරියාකන්ද මායිමේ ඇති වැව් බැම්ම අසල මෝටර් යොදා මැණික් ගරන බවට පැමිණිල්ලක් ලැබී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම අනවසර මැණික් හෑරීම නිසා වැවට පහලින් ඇති ගම්වල ගොවීන් උග්‍ර ජල ප්‍රශ්නයකට මුහුණ පා ඇති අතර ලෝක ප්‍රසිද්ධ පෝලෝ ක්‍රීඩා පිටියද විනාශවී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව පරීක්ෂාකර බලා මෙම මහා විනාශය නතර කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0413/'08

9.

ගරු පියසිරි විජේනායක මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පාසල් දන්ත චිකිත්සක සේවාව ආරම්භ වූ වර්ෂය කුමක්ද;

(ii) එම නිලධාරීන් දැනට පුහුණු කරන්නේ කවර ආයතනයක් මගින්ද;

(iii) අවසන් වරට පාසල් දන්ත චිකිත්සක නිලධාරිනියන් පුහුණු කරනු ලැබුවේ කවදාද;

(iv) ලංකාවේ දැනට සිටින පාසල් දන්ත චිකිත්සක නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(v) පුරප්පාඩු තිබෙන පාසල් දන්ත චිකිත්සක මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vi) එසේ පුරප්පාඩු වී තිබෙන සායන සඳහා පැමිණෙන දරුවන්ට සේවා සපයන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දරුවන් සඳහා පාසල් දන්ත චිකිත්සක නිලධාරිනියන් බඳවා ගැනීමට හේතු කවරේද;

(ii) අදාළ දෙපාර්තමේන්තුව මගින් බඳවා නොගන්නා ලද දැනට පුහුණුව අවසන්කර ඇති දන්ත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ සේවය රටට ලබා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0478/'08

10.

ගරු විජිත රණවීර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂය තුළදී හම්බන්තොට දිස්ත්‍රික් රන් එළිවැට විදුලි ව්‍යාපෘතිය යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් එක් විදුලිබල සංවර්ධන කාර්යය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල සහ එක් එක් යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය අවසන් වන විට ලබා දී තිබූ මුළු විදුලි සම්බන්ධතා සංඛ්‍යාව සහ 2007 වර්ෂයේ දී ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2007 වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව, පළාත් සභා, අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන මගින් අදාළ කොට්ඨාසයට විදුලිය සැපයීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන්ව කොපමණද;

(iii) එකී මුදලින් ලබා දී ඇති විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් පහසුකම් සපයා නොමැති නිසා විදුලිය ලබා නොගත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කොට්ඨාසයට අදාළව රන් එළිවැට විදුලි ව්‍යාපෘතියේ 2007 සැලසුම් සහ ඉලක්ක සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0479/'08

11.

ගරු විජිත රණවීර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂය තුළදී හම්බන්තොට දිස්ත්‍රික් රන් එළිවැට විදුලි ව්‍යාපෘතිය යටතේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් එක් විදුලිබල සංවර්ධන කාර්යය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල සහ එක් එක් යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය අවසන් වන විට ලබා දී තිබූ මුළු විදුලි සම්බන්ධතා සංඛ්‍යාව සහ 2007 වර්ෂයේ දී ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2007 වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව, පළාත් සභා, අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන මගින් අදාළ කොට්ඨාසයට විදුලිය සැපයීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන්ව කොපමණද;

(iii) එකී මුදලින් ලබා දී ඇති විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් පහසුකම් සපයා නොමැති නිසා විදුලිය ලබා නොගත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කොට්ඨාසයට අදාළව රන් එළිවැට විදුලි ව්‍යාපෘතියේ 2007 සැලසුම් සහ ඉලක්ක සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0480/'08

12.

ගරු විජිත රණවීර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂය තුළදී හම්බන්තොට දිස්ත්‍රික් රන් එළිවැට විදුලි ව්‍යාපෘතිය යටතේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් එක් විදුලිබල සංවර්ධන කාර්යය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ 2008 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල සහ එක් එක් යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂය අවසන් වන විට ලබා දී තිබූ මුළු විදුලි සම්බන්ධතා සංඛ්‍යාව සහ 2007 වර්ෂයේ දී ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2007 වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව, පළාත් සභා, අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන මගින් අදාළ කොට්ඨාසයට විදුලිය සැපයීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන්ව කොපමණද;

(iii) එකී මුදලින් ලබා දී ඇති විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් පහසුකම් සපයා නොමැති නිසා විදුලිය ලබා නොගත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එකී කොට්ඨාසයට අදාළව රන් එළිවැට විදුලි ව්‍යාපෘතියේ 2007 සැලසුම් සහ ඉලක්ක සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0499/'08

13.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වයි. එම්. ඩබ්ලිව්. එච්. එම්. ආර්. ආර්. බණ්ඩාර මහතා 2005.09.27 වැනි දින සිට 2007.01.12 වැනි දින දක්වා කෑගල්ල, ගලිගමුව, ඉද්දමල්පාන මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ලෙසද, 2007.01.12 වැනි දින සිට 2007.02.13 වැනි දින දක්වා වැඩබලන විදුහල්පති ලෙසද සේවය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලොග් සටහනකින් එම විදුහලේ විදුහල්පතිධූරය උපගුරු ඊ. විමලාවතී මහත්මියට පවරන ලද්දේ කවර පදනමකින්ද;

(ii) විදුහල්පතිධූරය බණ්ඩාර මහතාට ආපසු භාර දීමට සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ පී.එම්.ඒ.ඩී.07/04/03(11) හා 2007.02.27 දිනැති ලිපිය මගින් කැගල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දෙන ලද නියෝගය විමලාවතී මහත්මිය ප්‍රතික්ෂේප කර ඇති පදනම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගය කවරේද;

(iii) මේ සම්බන්ධව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ගේ තීරණය, කැගල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද; සහ

(iv) මේ සම්බන්ධව, සබරගමුව ප්‍රධාන ලේකම් අපක්ෂපාතී තීරණයක් දෙමින් 2007.12.17 දිනැති ලිපිය මගින් කෑ/ගලි/අරන්දර විදුහලේ විදුහල්පතිවරයාට ඉද්දමල්පාන මහා විද්‍යාලයට ස්ථාන මාරුවක් ලබාදෙන ලෙස සබරගමුව පළාත් අධ්‍යක්ෂ වෙත දුන් නියෝගය ක්‍රියාත්මක නොවූයේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙසේ විදුහල්පතිධූරයේ රැඳී සිටීමට විමලාවතී මහත්මියට අවශ්‍ය බලය ලැබුණේ කෙසේද;

(ii) ගැටලුව නිරාකරණය කිරීමට ලබාදුන් තීරණ ක්‍රියාත්මක කරන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0500/'08

14\.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ ගැසට් පත්‍රය නිකුත් කරන ලද්දේ කවදාද;

(ii) එකී තනතුර සඳහා අයදුම්කරන ලද සංඛ්‍යාව හා ඔවුන්ගේ සුදුසුකම් කවරේද;

(iii) ඔවුන් සඳහා සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ කවදාද;

(iv) සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනීසිටි සංඛ්‍යාව හා ඔවුන්ගේ උපරිම හා අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම තනතුර සඳහා පුස්තකාල සංඥාපන හා ප්‍රලේඛන උපාධිධාරීන් කොපමණ සංඛ්‍යාවක් ඉල්ලුම්කර තිබේද;

(ii) අදාළ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා දැනට සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iv) මෙම තනතුර සඳහා බඳවාගෙන ඇති පුස්තකාල සංඥාපන හා ප්‍රලේඛන උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0546/'08

15.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) රජයේ කාර්යාල සේවක සේවයේ 1 වැනි පංතියේ තනතුරක් වශයෙන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකාර තනතුරට, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2004 යටතේ ටී.බී.අයි.4 වැටුප් පරිමාණය අනුව වැටුප් ගෙවා ඇති බවත්;

(ii) නව වැටුප් සංශෝධනය යටතේ පී.එල්.අයි. 2006 වැටුප් පරිමාණයේ 22 වැනි පියවරේ තබා මෙම සේවක කොට්ඨාස දෙකටම වැටුප් ගෙවා ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන්ට පී.එල්.අයි. 2006 වැටුප් පරිමාණයේ 22 වැනි පියවරේ තබා මාස 10 ක් වැටුප් ගෙවීමෙන් පසුව, එසේ ගෙවන ලෙසට කෞතුකාගාර අධ්‍යක්ෂවරයා නිර්දේශ කර තිබියදීත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ මත 6/2001 චක්‍රලේඛයේ පී.එල්.අයි. 2006 වැටුප් පරිමාණයේ 18 වැනි පියවර දක්වා එම වැටුප පහත හෙළා ඇති බවත්;

(ii) මෙසේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන්ගේ වැටුප් පහත හෙළීම නිසා 6/2006 වැටුප් චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර ඔවුන් ලබමින් සිටි වැටුපට වඩා රු.450/- ක් අඩුවෙන් වැටුප් ලැබූ බවත්;

(iii) මෙම කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන් තමන්ට සිදුවී ඇති අසාධාරණය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අංක එම්.ආර්.සී.16747/06/එල්-13 යටතේ පැමිණිලි කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට කොමිෂන් සභාව 2007.11.21 වැනි දින තීරණය කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) (i) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන්ට සිදුවී ඇති මෙම වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නේ ද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහි ද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ජාතික මංමාවත් පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 117— වැඩසටහන 2,— † 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් බිලියන 9.792 (රු. 9,792,000,000) කට නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

ශීර්ෂය 117 — මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය

වැඩ සටහන 2 — සංවර්ධන වැඩසටහන

| | | | |
|---|---|---|---|
| | | | රු.මිලියන |
| ව්‍යාපෘතිය | — 3 | අධිවේගී මාර්ග සංවර්ධනය | 3,195 |
| | — 4 | මහා මාර්ග සංවර්ධනය | 2,030 |
| | — 5 | මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම | 1,160 |
| | — 6 | පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම | 2,485 |
| | — 7 | සුනාමියෙන් විපතට පත් මාර්ග පුනරුත්ථාපනය කිරීම | 422 |
| | — 8 | ආයතන සහාය | 500 |
| | | එකතුව | 9,792 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ඔක්තෝබර් මස 07 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 7 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 6 දක්වා එකතුව රුපියල් 15,511,980,332.

*3.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*4.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*7.

මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*12.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*15.

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*16.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*17.

විසර්ජන පනත් කෙටුම්පත (2009) — දෙවැනි වර කියවීම.

*18.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*19.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*20.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*21.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*22.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 “ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම” දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000<br>රු. 550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1) — ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 අප්‍රේල් මස 30 දිනැති අංක 1547/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2) — ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 අගෝස්තු මස 26 දිනැති අංක 1564/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නියෝග,— 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 29 වැනි වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු ඉහත කී පනතෙහි 6 වැනි වගන්තියේ (ආ) ඡේදය යටතේ ගනුදෙනුකරුවෙකුගේ ඉල්ලීම මත සිදු කරන විද්‍යුත් අරමුදල් මාරුවකදී මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු මුදල් ප්‍රමාණයේ අවම සීමාව නියම කරමින් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 25 දිනැති අංක 1555/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.10.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*27.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*29.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*30.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*35.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*36.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*37.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

38.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.